**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුරප්පාඩු වී ඇති නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා ද්විතීයන පදනම මත බඳවා ගැනීම.**

01 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා රජයේ අවශ්‍යතාවය මත ද්විතීයික පදනම මත බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ සේවය කරන මේ සඳහා උනන්දුවක් දක්වන නිලධාරීන් සිය අයදුම්පත්, ජීව දත්ත පත්‍රිකාව (CV), රාජ්‍ය සේවයේ සේවාව තහවුරු කිරීමේ ලිපිය, අදාළ වෘත්තීය සුදුසුකම් ලේඛනවල සහතික කළ පිටපත් සහ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් 2025.03.17 දින හෝ එදිනට පෙර ලැබෙන සේ විද්‍යුත් තැපැලෙන් එවිය යුතුය.

03. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී පහත කරුණු සැලකිල්ලට ගත යුතුය.

i. ජීව දත්ත පත්‍රිකාවෙහි නම, ජාතික හැඳුනුම්පත් අංකය, සක්‍රීය දුරකථන අංකයක් පැහැදිලිව සඳහන් කළ යුතුය

ii. මෙම තනතුරු සඳහා අයදුම් කළ හැක්කේ දීප ව්‍යාප්ත සේවයක II/III ශ්‍රේණියේ SL 1 – 2016 කාණ්ඩය යටතේ වැටුප් ලබන නිලධාරීන්ට පමණි.

iii. සුදුසුකම් ලත් නිලධාරීන් කාණ්ඩ,

| පුරප්පාඩු තනතුර | මූලික අධ්‍යාපන සුදුසුකම් (පහත සඳහන් ක්ෂේත්‍රවලින් එකක උපාධිය) | සුදුසුකම් ලත් නිලධාරීන් |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (ජාල) | විදුලි සංදේශ හෝ ඉලෙක්ට්‍රොනික හෝ විදුලි ඉංජිනේරු හෝ තොරතුරු තාක්ෂණය | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ II / III ශ්‍රේණියේ නිලධාරීන් |
| සහකාර අධ්‍යක්ෂ (යටිතල පහසුකම් නඩත්තු හා සංවර්ධන) | සිවිල් ඉංජිනේරු | |
| සහකාර අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ) | විදුලි ඉංජිනේරු | |
| සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | මූල්‍ය හෝ ගිණුම්කරණය හෝ වාණිජ්‍යය | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II / III ශ්‍රේණියේ නිලධාරීන් |
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ මානව සම්පත් සංවර්ධනය හෝ ව්‍යාපාර පරිපාලනය | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II / III ශ්‍රේණියේ නිලධාරීන් |
| සහකාර අධ්‍යක්ෂ (සැලසුම් සහ ආයතනික කටයුතු) | රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්ති හෝ සැලසුම් හෝ ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය හෝ ආර්ථික විද්‍යාව හෝ විදුලි සංදේශ හෝ විද්‍යාව | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ / සැලසුම් සේවයේ II / III ශ්‍රේණියේ නිලධාරීන් |

| | | |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ (තරඟකාරිත්ව) | අලෙවි කළමනාකරණය හෝ විදුලි සංදේශ හෝ මූල්‍ය හෝ වාණිජ හෝ ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර පරිපාලනය හෝ සංඛ්‍යානය | දීප ව්‍යාප්ත සේවයක II / III ශ්‍රේණියේ නිලධාරීන් |

i. PDF ආකෘතියෙන් සකස් කරන ලද අයදුම්පත careers@trc.gov.lk වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. ඔබ අයදුම් කරන තනතුර ඔබේ විද්‍යුත් තැපෑලෙහි විෂයය යටතේ සඳහන් කළ යුතුය.

iv. වැඩිදුර විමසීම් 0112-2689345 දුරකථන අංකය ඔස්සේ සිදු කළ හැකිය.

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව